<u>**කැස්බෑව දිසා අධිකරණයේදීය.**</u>

**ඕෂල හේරත්,**
අංක 22, වට මාවත,
පිළියන්දල.

<u>**පැමිණිලිකරු**</u>

**නඩු අංකය:**
ස්වභාවය: විශේෂ
කාර්ය පටිපාටිය: සාමාන්‍ය
වටිනාකම: රු. 1,000,000/-

**එදිරිව**

1. **කපිල තැම්ණිමුල්ල,**
අංක 3/1,
සංඝමිත්තා මාවත,
මහනුවර.

<u>සහ</u>

පක්ෂ නායක සහ ලේකම්,
අභිනව නිවහල් පෙරමුණ ප්‍රධාන
කාර්යාලය,
අංක 3/1, සංඝමිත්තා මාවත,
මහනුවර.

<u>සහ</u>

අභිනව නිවහල් පෙරමුණ ප්‍රධාන
කාර්යාලය,
අංක 963/B,
ගනේමුල්ල පාර,
මා-එළිය,
ජා-ඇල.

2. **අමිත් වීරසිංහ,**
අංක 64,
අඹසෙවනගම,
දිගන.

3. **දැකුම් දුලාර ගුණතිලක,**
අංක 253A,
විහාර මාවත,
වැබඩ.

4. **පාලිත ලක්ෂ්මන්,**
දෙද්දු වල ගෙදර,
මුකලන්යාය,
උඉරුගමුව.

5. **අසෝකා මානෙල් හේමසිංහ**,
94/1, පුලිනතලාරාම පාර,
මාගම්මන,
රාගම.

6. **ජනිත් විපුලගුණ,**
ලැබීම පාර,
දෙමටපිටිය,
වලස්ගල.

<u>සහ</u>

කාරක සභික,
අභිනව නිවහල් පෙරමුණ ප්‍රධාන
කාර්යාලය,
අංක 3/1, සංඝමිත්තා මාවත,
මහනුවර.

<u>සහ</u>

අභිනව නිවහල් පෙරමුණ ප්‍රධාන
කාර්යාලය,
අංක 963/B,
ගනේමුල්ල පාර,
මා-එළිය,
ජා-ඇල.

7. **එන්. ඩී. ජේ රත්නකුමාර
නාහල්ල,**
නාහල්ල නිවස,
යාපනය පාර,
පුලියන්කුලම,
අනුරාධපුර.

<u>සහ</u>

කාරක සභික,
අභිනව නිවහල් පෙරමුණ ප්‍රධාන
කාර්යාලය,
අංක 3/1, සංඝමිත්තා මාවත,
මහනුවර.

<u>සහ</u>

අභිනව නිවහල් පෙරමුණ ප්‍රධාන
කාර්යාලය,
අංක 963/B,
ගනේමුල්ල පාර,
මා-එළිය,
ජා-ඇල.

<u>**වින්තිකරුවන්**</u>

වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 25 වන දින දීය.

ඉහත නම් සඳහන් පැමිණිලිකරු ස්වකීය නීතිඥ ආර්.එම්.එස්. පූර්ණිමා රත්නායක මගින් පෙනී සිටිමින් ඉදිරිපත් කරනු ලබන **පැමිණිල්ල** මෙසේය.

1. පැමිණිලිකරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන අතර වරින් වර සංශෝධිත 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ හා එහි කොන්දේසි අනුව පිළිගත් දේශපාලන පක්ෂයක් වන "අභිනව නිවහල් පෙරමුණ" නමැති පක්ෂයේ සාමාජිකයකු සහ වර්තමාන සභාපතිවරයාද වේ.

2. ඉහත නම් සඳහන් පැමිණිලිකරු පදිංචිව සිටින්නේ මෙම අධිකරණයේ අධිකරණ බල සීමාව තුළදී බැවින් මෙම නඩුව අසා නිම කිරීම සඳහා මෙම ගරු අධිකරණයට අධිකරණ බලය ඇති බවට මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

3. "අභිනව නිවහල් පෙරමුණ" සංස්ථාගත කර නොමැති ආයතනයක් වන බැවින්, නියෝජිත තත්වයෙන් නඩු පැවරිය යුතු නිසා විත්තිකරුවන්ට එරෙහිව නඩු පැවරීම පිණිස සිවිල් නඩු විධාන සංග්‍රහයේ 16 වන වගන්තිය යටතේ සහ ඒ අනුව නියෝගයක් ලබා ගැනීමට පැමිණිලිකරු අපේක්ෂා කරන බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී. එකී නියෝජිත තත්වයට අමතරව, 1 සිට 5 වන විත්තිකරුවන්ට එරෙහිව පුද්ගලික තත්වයෙන් ද මෙම නඩුව පවරා ඇත.

4. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ, අභිනව නිවහල් පෙරමුණ පක්ෂය වර්ෂ 1981 හි අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතෙහි විධිවිධාන යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් පිළිගන්නා ලද දේශපාලන පක්ෂයක් වන බවත්, පක්ෂයේ ප්‍රධාන කාර්යාලය අංක 3/1, සංඝමිත්තා මාවත, මහනුවර යන ස්ථානයේ පවත්වාගෙන යන බවත්, එහි තැපැල් ලිපිනය ලෙස අංක 963/B, ගනේමුල්ල පාර, මා-එළිය, ජා-ඇල භාවිතා කරන බවත්ය.

   *එකී කරුණ සනාථ කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ්පිටුවෙන් බාගතකරගත් අභිනව නිවහල් පෙරමුණ පක්ෂයෙහි ව්‍යවස්ථා මාලාවේ සත්‍ය පිටපතක් සහ මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ්පිටුවෙන් බාගතකරගත් පිළිගත් දේශපාලන පක්ෂ ලැයිස්තුවේ පිටපතක් පිලිවෙලින් **'X-1'** සහ **X-2'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

5. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ අභිනව නිවහල් පෙරමුණ පක්ෂයෙහි වත්මන් සභාපති ලෙස පැමිණිලිකරු 2023.09.23 දින පවත්වන ලද විධායක සභා රැස්වීමෙන් පත් වන ලද බවත්, අභිනව නිවහල් පෙරමුණ පක්ෂයෙහි ව්‍යවස්ථා මාලාවේ 8 වන වගන්තිය අනුව 2023.09.23 වන දින පත්වන ලද විධායක මණ්ඩලයේ නිල කාලය වසර පහක් වන බවත්, වර්ෂ 2024 හි පැවති

ජනාධිපතිවරණයට අභිනව නිවහල් පෙරමුණ පක්ෂය නියෝජනය කරමින් පැමිණිලිකරු තරඟ වැද ඇති බවත්, වර්ෂ 2025 හි පැවති මහමැතිවරණයේදී අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ වැඩබලන ලේකම් ලෙස පැමිණිලිකරු කටයුතු කරන ලද බවත්ය.

*එකී කරුණ සනාථ කිරීම සඳහා 2023.09.23 වන දිනැතිව 1 වන වින්තිකරු විසින් නිකුත් කරන ලද 'අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ සභාපති නිල පත්වීමේ ප්‍රධානය' යන ශීර්ෂය දරණ ලිපියෙහි සත්‍ය පිටපතක්, සහ මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ්පිටුවෙන් බාගතකරගත් 2024 ජනාධිපත්වරණ මැතිවරණ ප්‍රතිපල ලේඛනයෙහි සත්‍ය පිටපතක් **'X-3'** සහ **'X-4'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

6. 1 වන වින්තිකරු අභිනව නිවහල් පෙරමුණෙහි පක්ෂ නායක සහ ලේකම් වන බවත්, 2 වන වින්තිකරු එකී අභිනව නිවහල් පෙරමුණෙහි පක්ෂ නායක ලෙස හුවා දක්වමින් සමාජ මාධ්‍යන්හි පෙනී සිටිමින් මහජනතාව මුලා කරමින් සිටින බවත්, 2 වන වින්තිකරු සමඟ එක්ව 3, 4, සහ 5 වන වින්තිකරුවන් පක්ෂයෙහි පරමාර්ථයන්ට එරෙහිව කටයුතු කරමින් සිටින බවත් මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටී.

   *එකී කරුණ සනාථ කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ්පිටුවෙන් බාගතකරගත් අභිනව නිවහල් පෙරමුණෙහි නිලධාරී මණ්ඩලය පෙන්නුම් කරන ලේඛනයෙහි සත්‍ය පිටපතක් සහ 2 වන වින්තිකරු අභිනව නිවහල් පෙරමුණෙහි පක්ෂ නායක යැයි පෙන්නුම් කරමින් සමාජ මාධ්‍යන්හි පලකරන ලද සටහන්හි ('Facebook Posts') පිටපත් සම්පිණ්ඩනයක් ලෙස පිළිවෙලින් **'X-5'** සහ **'X-6'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

7. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ,

   (අ) අභිනව නිවහල් පෙරමුණෙහි විධායක සභා සාමාජිකයින් ඇතුළත් වට්සැප් සමූහයෙහි ('Whatsapp Group') 2025.10.03 වන දින මාර්ගගතව හුවමාරු වූ පණිවිඩයක් මඟින් අභිනව නිවහල් පෙරමුණෙහි මහා සභා රැස්වීම 2025.10.05 වන දින පැවැත්වීමට යන බව පැමිණිලිකරු ප්‍රථම වරට දැනගත් බවත්,

   (ආ) ඉන් පසුව 2025.10.05 වන දින වට්සැප් හි සංසරණය වූ ෆේස්බුක්හි පළ වූ **'අමිත් වීරසිංහ ඇතුළු කණ්ඩායමක් අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ බලය අල්ලයි'** යැයි පෙන්නුම් කරන තිරපිටපතක් පැමිණිලිකරුට ලැබුණු බවත්,

   (ඇ) එබැවින් විධායක මණ්ඩල අනුමැතියක් නොමැතිව, පක්ෂ ව්‍යවස්ථාවට පටහැනිව, පක්ෂ සාමාජිකයන්ට දැනුම් නොදී කැඳවන ලද එකී රැස්වීම පිළිබඳව සහ 2 වන වින්තිකරු පක්ෂ නායක ලෙස උද්දේශිතව පත් කිරීම පිළිබඳව කරුණු විමසීමට පැමිණිලිකරු 1 වන වින්තිකරුට තම නිවසට පැමිණීමට ආරාධනා කල බවත්,

   (ඇ) 2025.10.06 වන දින 1 වන වින්තිකරු මුණ ගැසුණු විට ඔහු තැති ගැනීමකින් සිටින බව පැමිණිලිකරුට පෙනී ගිය බවත්, වෙනත් කරුණු අතර 2025.10.05 වන දින පවත්වන ලද මහා සභා රැස්වීම 2 වන වින්තිකරු ඇතුළු ඔහුගේ කණ්ඩායමක් විසින් එකී රැස්වීමෙහි ක්‍රියාදාමය 1 වන

විත්තිකරුගේ ග්‍රහණයෙන් පැහැර ගැනීමක් සිදු වූ බව 1 වන විත්තිකරු පැමිණිලිකරුට පැවසූ බවත්ය.

*එකී කරුණ සනාථ කිරීම සඳහා ඉහත කී වට්සැප්හි සංසරණය වූ **'අමිත් වීරසිංහ ඇතුළු කණ්ඩායමක් අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ බලය අල්ලයි'** යැයි පෙන්නුම් කරන තිරපිටපතක් සහ ඉහත කී සිදුවීම් පිළිබඳව 2025.10.08 වන දින පොලිස්පති වෙත ගොනු කරන ලද පැමිණිල්ලෙහි පිටපතක් **'X-7'** සහ **'X-7(අ)'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

8. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ, 2025.10.10 වන දින හෝ ඊට ආසන්න දිනයකදී පැමිණිලිකරුට ලැබුණු 2025.10.07 වන දිනැති ලිපියක් මඟින් නීතිඥවරයෙකු හරහා පැමිණිලිකරුව දැනුවත් කරන ලද්දේ 2025.10.05 වන දින උද්දේශිතව පවත්වන ලද අභිනව නිවහල් පෙරමුණෙහි මහා සභා රැස්වීමේදී නව පක්ෂ නායක ලෙස 2 වන විත්තිකරු සභා සම්මත වී ඇති බවත්, එම සංශෝධිත පක්ෂයේ නව ව්‍යවස්ථාව බලාත්මක කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවට භාර දෙන ලද ලෙස පැමිණිලිකරුගෙන් ඉල්ලා ඇති බවත්ය.

   *එකී කරුණ සනාථ කිරීම සඳහා 2025.10.07 වන දිනැති ලිපියෙහි සත්‍ය පිටපතක් **'X-8'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

9. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ එකී 2025.10.05 වන දිනැති අභිනව නිවහල් පෙරමුණෙහි මහා සභා රැස්වීම මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පක්ෂ ව්‍යවස්ථාවේ 14 වන වගන්තිය ප්‍රකාරව පැමිණිලිකරු ඇතුළු විධායක මණ්ඩල අනුමැතිය නොමැතිව, එකී පක්ෂ ව්‍යවස්ථාවට පටහැනිව, පක්ෂ ව්‍යවස්ථාවේ 14 වන වගන්තිය ප්‍රකාරව මහා සභා රැස්වීමක් පිළිබඳව පක්ෂ සාමාජිකයින්ට දින 14 කට පෙර දැනුම් දීමක් නොදී පවත්වන ලද මහා සභා රැස්වීමක් බැවින් ව්‍යවස්ථානුකූල නොවන සහ නීතියට පටහැනි වන බවයි.

10. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ එකී 2025.10.05 වන දිනැති අභිනව නිවහල් පෙරමුණෙහි මහා සභා රැස්වීම පිළිබඳව ඉහත සඳහන් ආකාරයට දැනුවත්වීමෙන් අනතුරුව එකී රැස්වීම පිළිබඳව වැඩිදුර කරුණු අනාවරණය කර ගැනීම සඳහා පැමිණිලිකරු විසින් මැතිවරණ ලේකම් කාර්යාලයට 2016 හි අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉල්ලීමක් සිදු කර බවයි.

    *එකී කරුණ සනාථ කිරීම සඳහා 2025.10.08 වන දින මැතිවරණ ලේකම් කාර්යාලයට ගොනුකරන ලද ලිපියෙහි පිටපත **'X-9'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

11. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ 2016 හි අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ පැමිණිලිකරු විසින් ඉල්ලා සිටින ලද තොරතුරු සහ ලේඛණ මැතිවරණ කොමිෂන් සභාව විසින් 2025.10.10 වන දින ලබා දුන් බවත්, එකී ලේඛණ අතර අභිනව නිවහල් පෙරමුණෙහි 2025.10.05 වන දින පැවැත්වූ වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව, 2025.07.21 වන දිනැති විධායක මණ්ඩල රැස්වීම් වාර්තාව සහ 2025.10.05 වන දින පැවැත්වූ වාර්ෂික මහා සභා රැස්වීමේදී සම්මත කරගෙන ඇති සංශෝධිත ව්‍යවස්ථාව ඇතුළත් වන බවයි.

*එකී කරුණ සනාථ කිරීම සඳහා 2025.10.10 වන දිනැති ලිපියෙහි සත්‍ය පිටපතක්, ඊට අමුණා ඇති අභිනව නිවහල් පෙරමුණෙහි 2025.10.05 වන දින පැවැත්වූ වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාවෙහි පිටපතක්, 2025.07.21 වන දිනැති විධායක මණ්ඩල රැස්වීම් වාර්තාව, සහභාගී වූ නිලධාරී මණ්ඩලයේ නාම ලේඛනය, අත්සන් ලේඛනයෙහි පිටපතක්, 2025.10.05 වන දින පැවැත්වූ වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව භාරදුන් පුද්ගලයාගේ බලය පැවරීමේ ලිපිය සහ 2025.10.05 වන දින පැවැත්වූ වාර්ෂික මහා සභා රැස්වීමේදී සම්මත කරගෙන ඇති සංශෝධිත ව්‍යවස්ථාවෙහි පිටපතක් පිලිවෙලින් **'X-10'**, **'X-10(අ)'**, **'X-10(ආ)'**, **'X-10(ඇ)'** **'X-10(ඈ)'** **'X-10(ඉ)'** සහ **'X-10(ඊ)'** ලෙසත් සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

12. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ මැතිවරණ කොමිෂන් සභාව විසින් 2025.11.08 වන දිනදී අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ 2025.09.21 වන දින පැවති විධායක සභා රැස්වීම සහ 2025.10.05 දින පැවති වාර්ෂික මහසභා රැස්වීම සම්බන්ධයෙන් වැඩිදුර කරුණු පැහැදිලි කිරීම් කිහිපයක් ඉල්ලා ඇති බවත්, 1 වන විත්තිකරු විසින් 2025.12.15 වන දින එකී ලිපියට පිළිතුරු ලබා දී ඇති බවත්ය.

*එකී කරුණ සනාථ කිරීම සඳහා 2025.11.19 වන දිනැති ලිපිය මඟින් මැතිවරණ කොමිෂන් සභාව විසින් පැමිණිලිකරු වෙත ඇමුණුම්ගතව එවන ලද 2025.11.08 දිනැති ලිපියෙහි සත්‍ය පිටපතක් සහ 2025.12.22 වන දිනැති ලිපිය මඟින් මැතිවරණ කොමිෂන් සභාව විසින් පැමිණිලිකරු වෙත ඇමුණුම්ගතව එවන ලද 2025.12.15 දිනැති ලිපියෙහි සත්‍ය පිටපතක් පිලිවෙලින් **'X-11'** සහ **'X-12'** ලෙසත් සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

13. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ ඉහත කී '**X-12'** ලෙස සලකුණු කරන ලද ලේඛනයෙන් පහත කරුණු අනාවරණය වන බවයි, එනම්,

(අ) 2025.07.21 වන දින පැවති විධායක කමිටු රැස්වීමේදී ඉදිරිපත් කර ඇති සංශෝධන සඳහා මහා සභාවක අනුමැතිය අවශ්‍ය බවට මැතිවරණ කොමිෂන් සභාවේ නීති අංශයෙන් කරන ලද පැහැදිලි කිරීමෙන් පසු 2025.10.05 වන දින උද්දේශිත විශේෂ මහා සභා රැස්වීම පවත්වා ඇති බවත්,

(ආ) 2025.07.21 දින පැවති උද්දේශිත විධායක කමිටු රැස්වීම සම්බන්ධයෙන් 1 වන විත්තිකරු විසින් ගොනු කර ඇති '**X-10(ඇ)**' සහ '**X-10(ඈ)**' ලෙස ඉහත සලකුණු කරන ලද කරුණු සාවද්‍ය වන බවත්ය.

14. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ 2025.09.21 වන දින පැවති විධායක සභා රැස්වීම සහ 2025.10.05 දින පැවති වාර්ෂික මහසභා රැස්වීම ව්‍යවස්ථානුකූල නොවන බවත්, විශේෂයෙන්ම ඉහත කී 2025.12.15 වන දිනැති ලිපිය මඟින් 1 වන විත්තිකරු විසින් මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද කරුණු පැහැදිලිකිරීම් පිළිබඳව අවධානය යොමු කරමින්, ලිපි සහ විද්‍යුත් පණිවිඩ මඟින් පැමිණිලිකරු මැතිවරණ කොමිෂන් සභාව දැනුවත් කරන ලද බවයි.

*එකී කරුණ සනාථ කිරීම සඳහා අභිනව නිවහල් පෙරමුණෙහි සභාපති ලෙස කටයුතු කරමින් 2025.12.15 දින සහ 2025.12.26 වන දින මැතිවරණ කාර්යාලයට යවන ලද ලිපිහි පිටපත්, පැමිණිලිකරු විසින් මැතිවරණ කොමිෂන් සභාවට යවන ලද 2025.12.30 වන දිනැති විද්‍යුත්*

*පණිවිඩයෙහි පිටපතක් සහ අභිනව නිවහල් පෙරමුණෙහි සභාපති ලෙස කටයුතු කරමින් 2026.01.12 වන දින මැතිවරණ කොමිෂන් සභාවට යවන ලද ලිපියෙහි පිටපතක් පිලිවෙලින් **'X-13'** , **'X-14'**, **'X-15'** සහ **'X-16'** ලෙසත් සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

15. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ 2026.01.18 වන දින 1 වන වින්තිකරු විසින් සියළුම පක්ෂ සාමාජිකයින්ගේ දැනගැනීම පිණිස යැයි ප්‍රකාශ කරමින් 2025.10.05 වන දින උද්දේශිතව පවත්වන ලද පක්ෂ මහා සභාවේදී පක්ෂ නායක ලෙස 2 වන විත්තිකරු පත්කරන ලද බව දැනුම් දෙන ලද බවයි.

*එකී කරුණ සනාථ කිරීම සඳහා 2026.01.18 වන දිනැති ලිපියෙහි පිටපතක් **'X-17'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

16. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ ඉන් අනතුරුව, මැතිවරණ කොමිෂන් සභාව විසින් අංක EC/RPP/2008/50 සහ 2026.01.20 දිනැති ලිපිය මඟින් අභිනව නිවහල් පෙරමුණෙහි ලේකම් වන 1 වන විත්තිකරු වෙත දැනුම්දෙන ලද්දේ;

**(අ) 2025.10.05 වන දින කැඳවන ලද අභිනව නිවහල් පෙරමුණෙහි වාර්ෂික මහා සභා රැස්වීම ව්‍යවස්ථානුකූලව පවත්වා නොමැති බැවින් පක්ෂ ව්‍යවස්ථා සංශෝධනය හා නව නිලධාරීන් පත්වීම මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිනොගන්නා බවත්;**

**(ආ) එබැවින් වාර්ෂික මහ සම්මේලනය පක්ෂ ව්‍යවස්ථාවට අනුකූලව පවත්වා අදාළ ලේඛන කඩිනමින් මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙසත්;**

**(ඇ) එමෙන්ම, 1 වන විත්තිකරු විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත ලේඛණ ඉදිරිපත් කිරීමේදී 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8(2) හා 8(3) උපවගන්ති අනුව ක්‍රියා කර නොමැති බව නිරීක්ෂණය වන බැවින් පනතේ 9(1) උපවගන්තිය අනුව ක්‍රියා කිරීම කෙරෙහි මැතිවරණ කොමිෂන් සභාවේ අවධානය යොමු වන බවත්ය.**

*එකී කරුණ සනාථ කිරීම සඳහා* තොරතුරු දැන ගැනීමේ පනත යටතේ *පැමිණිලිකරු විසින් 2026.02.02 දිනැති ලිපිය මඟින් මැතිවරණ ලේකම් කාර්යාලයට කල ඉල්ලීමෙහි පිටපතක්, මැතිවරණ කොමිෂන් සභාව විසින් පැමිණිලිකරු වෙත එවන ලද 2026.02.05 වන දිනැති ලිපිය සහ ඊට ඇමුණුම්ගතව එවන ලද අංක EC/RPP/2008/50 සහ 2026.01.20 දිනැති ලිපියෙහි සත්‍ය පිටපත්, පිළිවෙලින් **'X-18'**, **X-19'** සහ **'X-19(අ)'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

17. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ එමෙන්ම මේ අතරතුර කාලයේදී, 2 වන විත්තිකරු අභිනව නිවහල් පෙරමුණෙහි පක්ෂ නායක ලෙස පෙනී සිටිමින් එම පක්ෂයේ නාමය සහ ලාංජනය අවභාවිතා කරමින් සහ පක්ෂයේ කීරිති නාමයට දැඩි හානියක් කරමින්, සමාජය සහ පාක්ෂිකයින් නොමඟ යවමින් සහ එකී විත්තිකරුගේ පෞද්ගලික අදහස් පක්ෂයේ අදහස් ලෙස හුවා දක්වමින් පක්ෂයේ කීර්ති නාමට හානි කරමින් කටයුතු කරන බැවින්, පක්ෂයේ නම හෝ පක්ෂය නියෝජනය කිරීමෙන් සම්පූර්ණයෙන් වැලකී සිටින ලෙස දන්වමින් එකී හැසිරීම නවත්වා අත්හරින ලෙස පක්ෂ

සභාපති ලෙස පැමිණිලිකරු විසින් 2026.01.17 වන දිනැති ලිපිය මඟින් 2 වන විත්තිකරුට දැනුම් දුන් බවත්ය.

*එකී කරුණ සනාථ කිරීම සඳහා 2026.01.17 වන දිනැති 2 වන විත්තිකරු වෙත යවන ලද ලිපියෙහි පිටපතක් '**X-20**' ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

18. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ ඉහත කී '**X-20**' ලිපියට පිළිතුරු වශයෙන් 2026.01.30 වන දින 2 වන විත්තිකරුගේ නීතීඥවරයා විසින් එන්තරවාසියක් හරහා පැමිණිලිකරු වෙත දැනුම් දෙන ලද්දේ 2025.10.05 වන දින උද්දේශිතව කැඳවන ලද අභිනව නිවහල් පෙරමුණෙහි පක්ෂ මහා සභා රැස්වීමෙන් උද්දේශිතව එකී පක්ෂයෙහි පක්ෂ නායක ලෙස 2 වන විත්තිකරු පත්ව ඇති බැවින් පැමිණිලිකරු විසින් 2 වන විත්තිකරුගේ පත්වීම පිළිබඳව සමාජ මාධ්‍ය හරහා පළකරන තොරතුරු හේතුවෙන් උද්දේශිතව සිදුවී ඇති අලාභය ඉල්ලා එකී එන්තරවාසිය එවන ලද බවයි.

*එකී කරුණ සනාථ කිරීම සඳහා 2026.01.30 වන දිනැති එන්තරවාසියෙහි සත්‍ය පිටපතක් '**X-21**' ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

19. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ නමුත් එකී 2026.01.30 වන දිනැති එන්තරවාසිය යවන විටත් එකී 2 වන විත්තිකරුගේ උද්දේශිත පත්වීම ව්‍යවස්ථානුකූලව නොවන බව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2026.01.20 දිනැති මින් පෙර '**X-19**' ලෙස ලකුණු කර ඇති ලිපිය මඟින් තීරණය කොට ඇති බවත්, එබැවින් එකී තීරණයට ගරු නොකර 2 වන විත්තිකරු අභිනව නිවහල් පෙරමුණෙහි අනීතිකව සහ ව්‍යවස්ථානුකූල නොවන ලෙස රැඳී සිටීමට උත්සාහ කරන බව එකී එන්තරවාසිය මඟින් හැඟී යන බවත්ය.

20. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ;

(අ) 2 වන විත්තිකරු මහසෝන් බලකායේ නායක වන බව ප්‍රකට කරුණක් බවත්;

(ආ) 2018 වර්ෂයේදී දිගන සහ පූජාපිටිය පළාත්හි ඉස්ලාම් විරෝධී සහ අන්තවාදී ප්‍රචාරක කටයුතු කරමින්, වෛරය අවුළුවා දේපල සහ ජීවිත හානි සිදු කරමින්, ජාතිවාදී ව්‍යාපාරයක නියත වෙමින්, ප්‍රචණ්ඩත්වයට අනුබල දීමේ ප්‍රධාන සැකකරු වශයෙන් ත්‍රස්ත විමර්ෂණ ඒකකයේ විශේෂ මෙහෙයුමකින් 2 වන විත්තිකරු එකී සිදුවීමෙහි ප්‍රධාන සැකකරු බවට හඳුනාගෙන ඔහුව 2018.03.08 වන දින හෝ ඊට ආසන්න දිනයකදී අත්අඩංගුවට ගෙන ඇති බවත්;

(ඇ) 'Global Sri Lankan Forum' යනු 2017 සිට ශ්‍රී ලංකාවේ මුස්ලිම් ආගමට විරුද්ධව කෝලාහල කිරීම සඳහා මුදල් සපයන යුරෝපය පදනම්ව ඇති ඩයස්පෝරාවෙන් 2, 3, 4 සහ 5 වන විත්තිකරුවන් වෙත එකී ඩයස්පෝරාවෙන් අරමුදල් ලබාදෙන බව පරීක්ෂණ මඟින් අනාවරණය වී ඇති බවත්,

(ඈ) එකී විත්තිකරුවන් විසින් 2025.10.05 වන දින කැඳවන ලද අභිනව නිවහල් පෙරමුණෙහි වාර්ෂික මහා සභා රැස්වීම මඟින් ඔවුන්ගේ ජාතිවාදී, ආගම්වාදී අරමුණු ක්‍රියාත්මක කිරීමේ මෙවලමක් ලෙස පක්ෂය යොදා ගැනීමට උත්සාහ දරමින් සිටින බව පෙනී යන බවත්;

(ඉ) එබැවින් 2 වන විත්තිකරුගේ එකී හැසිරීම පිළිබඳව දැනුම් දෙමින් ඊට විරුද්ධව ක්‍රියා කරන ලෙස පොලිස්පති අමතා පැමිණිලිකරු දැනුම් දුන් බවත්ය.

*එකී කරුණ සනාථ කිරීම සඳහා 2018 වර්ෂයේදී දිගන සහ පූජාපිටිය පළාත්හි සිදු වූ සිදුවීම පිළිබඳව පළවූ පුවත්පත් ලිපිහි පිටපත් සම්පිණ්ඩනයක්, 2026.01.06 දිනැති සහ 2026.01.18 වන දිනැති පොලිස්පති වෙත යවන ලද ලිපියෙහි පිටපතක්, සහ 2026.02.21 වන දින ෆේස්බුක් ('Facebook') වෙත යවන ලද ලිපියෙහි පිටපතක් පිලිවෙලින් **'X-22' 'X-23'**, **'X-24'** සහ **'X-25'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

21. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ ඉන් අනතුරුව 2026.02.12 වන දින 1 වන විත්තිකරු විසින් පැමිණිලිකරු වෙත ලියාපදිංචි තැපැලෙන් ලිවුම් කවරයක බහාලා කිසිවක් නොලියවන ලද හිස් A4 වර්ගයේ කඩදාසි සහ ටිෂූ කොළ පමණක් එවන ලද බවත්, මෙම සිදුවීම පිළිබඳව සැක සිතී, මතු ආරක්ෂාව ගැන සලකා එදිනම පිළියන්දල පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් පැමිණිලිකරු විසින් ගොනු කරන ලද බවයි.

*එකී කරුණ සනාථ කිරීම සඳහා 2026.02.12 වන දින 1 වන විත්තිකරු විසින් පැමිණිලිකරු වෙත ලියාපදිංචි තැපැලෙන් එවන ලද කිසිවක් නොලියවන ලද හිස් A4 වර්ගයේ කඩදාසි සහ ටිෂූ කොළ පෙන්නුම් කරන ඡායාරූප, සහ පිළියන්දල පොලිස් ස්ථානයේ ගොනු කරන ලද අංක C 324/112 දරණ පැමිණිල්ලෙහි සත්‍ය පිටපත පිලිවෙලින් **'X-26'** සහ **'X-27'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

22. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ 2026.02.12 වන දින පෙ.ව. 1.20ට අභිනව නිවහල් පෙරමුණ විධායක සභා රැස්වීමක් කැඳවා ඇති බවත්, ඒ පිළිබඳව පැමිණිලිකරු පළමුවරට දැනුවත් වූයේ අභිනව නිවහල් පෙරමුණෙහි විධායක සභා සාමාජිකයින් ඇතුළත් වට්සැප් සමූහයෙහි ('Whatsapp Group') 2026.02.13 වන දින මාර්ගගතව හුවමාරු කරන ලද 2026.02.12 වන දිනැති විධායක සභා රැස්වීමෙහි වාර්තාව මඟින් බවත්ය.

*එකී කරුණ සනාථ කිරීම සඳහා අභිනව නිවහල් පෙරමුණෙහි විධායක සභා සාමාජිකයින් ඇතුළත් වට්සැප් සමූහයෙහි ('Whatsapp Group') 2026.02.13 වන දින එකී විධායක සභා රැස්වීමෙහි වාර්තාව මාර්ගගතව හුවමාරු වූ බව පෙන්නුම් කරන තිරපිටපත සහ 2026.02.13 වන දින මාර්ගගතව හුවමාරු කරන ලද 2026.02.12 වන දිනැති විධායක සභා රැස්වීමෙහි වාර්තාවෙහි පිටපතක් පිලිවෙලින් **'X-28'** සහ **X-29'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

23. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ එකී 2026.02.12 වන දිනැති විධායක සභා රැස්වීමෙහි වාර්තාවට අනුව, වෙනත් කරුණු අතර,

(අ) 2026.03.01 වන දින පෙ.ව. 11.00ට අභිනව නිවහල් පෙරමුණෙහි මහා සභා රැස්වීම සහ එදිනම ප.ව. 01.00ට පක්ෂ ව්‍යවස්ථා කටයුතු පිළිබඳව විශේෂ මහා සභා රැස්වීම පැවැත්වීමට අදහස් කරන ලද බවත්,

(ආ) එදින නව භාණ්ඩාගාරික වරයෙකු සහ පක්ෂ නායකයෙකු පත් කිරීමටත්;

(ඇ) උපග්‍රන්ථ ඒ යටතේ ඇති විනය නීති මාලාව සහ 14 වන වගන්තිය සංශෝධනය මහ සභාව විසින් සම්මත කොට විශේෂ මහා සභාවට ඉදිරිපත් කිරීමටත්, තීරණය කර ඇති බව සඳහන් කර ඇති බවයි.

24. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ එකී 2026.02.12 වන දිනැති විධායක සභා රැස්වීමෙහි උද්දේශිත තීරණයන්ට අනුව 2026.03.01 වන දින පැවැත්වීමට අරමුණු කරන අභිනව නිවහල් පෙරමුණෙහි මහා සභා රැස්වීම පිළිබඳව දැන්වීමක් අභිනව නිවහල් පෙරමුණෙහි නිල ෆේස්බුක් ('Facebook') ගිණුමෙහි නොව අභිනව නිවහල් පෙරමුණයැයි ව්‍යාජ ලෙස පෙන්නුම් කරන 2 වන වින්තිකරු විසින් සකස් කරන ලද ෆේස්බුක් ('Facebook') ගිණුමෙහි මාර්ගගතව හුවමාරු කර ඇති බවයි.

*එකී කරුණ සනාථ කිරීම සඳහා අභිනව නිවහල් පෙරමුණයැයි ව්‍යාජ ලෙස පෙන්නුම් කරන 2 වන වින්තිකරු විසින් සකස් කරන ලද ෆේස්බුක් ('Facebook') ගිණුමෙහි 2026.03.01 වන දින පැවැත්වීමට අරමුණු කරන පක්ෂ මහා සභා රැස්වීම පිළිබඳව පළකල දැන්වීමෙහි තිර පිටපතක් සහ අභිනව නිවහල් පෙරමුණෙහි නිල ෆේස්බුක් ('Facebook') ගිණුමෙහි සහ අභිනව නිවහල් පෙරමුණයැයි ව්‍යාජ ලෙස පෙන්නුම් කරන 2 වන වින්තිකරු විසින් සකස් කරන ලද ෆේස්බුක් ('Facebook') ගිණුම සංසන්දනය පිණිස ඒවායෙහි තිර පිටපත් සම්පිණ්ඩනයක් පිළිවෙලින් **'X-30'** සහ **'X-31'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

25. මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ ඉහත සඳහන් සිදුවීම් සම්බන්ධයෙන් 2026.02.17 වන දින මැතිවරණ ලේකම් කාර්යාලය වෙත අභිනව නිවහල් පෙරමුණෙහි සභාපති ලෙස කටයුතු කරමින් පැමිණිලිකරු විසින් පැමිණිල්ලක් ගොනු කරන ලද බවත්, වෙනත් කරුණු අතර, 2026.02.12 වන දින පැවැත්වූ විධායක සභා රැස්වීම සම්බන්ධයෙන් පැමිණිලිකරු ඇතුළු විධායක මණ්ඩල සභිකයින් කිහිප දෙනෙකුටම කිසිදු පූර්ව දැනුම්දීමක් සිදු කර නොමැති බවත්, එම රැස්වීම සහ වාර්තාව පක්ෂ ව්‍යවස්ථාවට පටහැනිව පවත්වා ඇති බවත් එමඟින් දැනුවත් කර ඇති බවයි.

*එකී කරුණ සනාථ කිරීම සඳහා 2026.02.12 වන දින පැවැත්වූ විධායක සභා රැස්වීම සම්බන්ධයෙන් දැනුම්දීමක් නොලැබුණු බව පෙන්නුම් කරන අභිනව නිවහල් පෙරමුණෙහි විධායක සභා සාමාජිකයින් ඇතුළත් වට්සැප් සමූහයට ('Whatsapp Group') 7 වන වින්තිකරු විසින් යවා ඇති පණිවිඩයෙහි තිරපිටපත සහ 2026.02.17 වන දින මැතිවරණ ලේකම් කාර්යාලය වෙත අභිනව නිවහල් පෙරමුණෙහි සභාපති ලෙස කටයුතු කරමින් පැමිණිලිකරු විසින් ගොනු කරන ලද පැමිණිල්ලෙහි පිටපතක් **'X-32'** සහ **'X-33'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

26. මෙම පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශකර සිටින්නේ;

(අ) ඉහත කී පැමිණිල්ලෙහි වැඩිදුරටත් සඳහන්ව ඇති පරිදි, 1 වන වින්තිකරු පක්ෂ නායක ලෙස ඉදිරිපත් කර ඇති ලිපි සඳහා ඔහුගේ අත්සන සහ නිල මුද්‍රාව තැබීම වෙනුවට අත්සනේ ඡායාරූපයක් ('scanned image') පරිගණක ආශ්‍රයෙන් ඇතුළත් කර ඇති බව පෙනී යන බවත්,

(ආ) එමඟින් මැතිවරණ කොමිෂන් සභාව නොමඟ යැවීමට කටයුතු කර ඇති බවත්, මැතිවරණ කොමිෂන් සභාවේ පටිපාටින්ට අනුව මැතිවරණ කොමිෂන් සභාවට යොමුකරන ලිපිහි ඩිජිටල් අත්සනක් ('digital signature') පවතින්නේ නම් එය විද්‍යුත් තැපැල මඟින් යොමු කල යුතු බවත්,

(ඇ) 2, 3, 4, 5 විත්තිකරුවන් 1 වන විත්තිකරුට බලපෑම් කරමින් පාලනය අත්පත් කර ගැනීමට උත්සාහ කිරීම සහ මෙකී සිදුවීමෙහි විත්තිකරුවන්ගේ මැදිහත් වීම **'X-33'** ලෙස සලකුණු කර ඇති පැමිණිල්ල සාක්ෂි දරණ බවත්ය.

27. පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශකර සිටින්නේ;

(අ) අභිනව නිවහල් පෙරමුණෙහි කළුතර දිස්ත්‍රික් වට්සැප් සමූහයෙහි **2026.02.23** වන දිනදී 5 වන විත්තිකරු විසින් සංසරණය කරන ලද 2026.02.19 දිනැති පක්ෂ නිවේදන ලේඛනයක් මඟින් 2026.03.01 වන දින පැවැත්වීමට යෝජිත වාර්ෂික මහා සභා රැස්වීම සහ විශේෂ මහා සභා රැස්වීම මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී පැවැත්වීමට ඇති බවට දැනුම් දුන් බවත් (ඉහත සලකුණු කර ඇති **'X-29'** වාර්තාවේ ස්ථානය සඳහන් කර නොතිබුණු බවට අවධාරණය කර සිටී);

(ආ) ඉහත කී 2026.02.19 දිනැති පක්ෂ නිවේදන ලේඛනයෙහි පාරදත්ත ('Meta Data') නිරීක්ෂණය කිරීමේදී 1 වන විත්තිකරු විසින් 2026.02.23 වන දින 06.58.54 වෙලාවේදී එකී ලේඛනය නිර්මාණය කර ඇති බවත්, එබැවින් සාවද්‍ය ලෙස එකී පක්ෂ නිවේදන ලේඛනයෙහි දිනය 2026.02.19 ලෙස සඳහන් කර ඇති බවත්ය.

*එකී කරුණ සනාථ කිරීම සඳහා අභිනව නිවහල් පෙරමුණෙහි කළුතර දිස්ත්‍රික් වට්සැප් සමූහයෙහි 2026.02.23 වන දිනදී 5 වන විත්තිකරු විසින් සංසරණය කරන ලද 2026.02.19 දිනැති පක්ෂ නිවේදන ලේඛනය පෙන්නුම් කරන තිරපිටපතක්, එකී වට්සැප් සමූහයෙහි 2026.02.23 වන දිනදී 5 වන විත්තිකරු විසින් සංසරණය කරන ලද 2026.02.19 දිනැති පක්ෂ නිවේදනයේ පිටපතක්, සහ 2026.02.19 දිනැති පක්ෂ නිවේදන ලේඛනයෙහි පාරදත්ත ('Meta Data') හි පිටපතක් පිළිවෙලින් **'X-34(අ)' 'X-34(ආ)'** සහ **'X-34(ඇ)'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

28. පැමිණිලිකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ,

(අ) අභිනව නිවහල් පෙරමුණෙහි කළුතර දිස්ත්‍රික් වට්සැප් සමූහයට 5 වන විත්තිකරු විසින් 2026.02.23 වන දින 'janith wipulaguna letter copy 24 11 2024' ලෙස නම් කරන ලද මෘදු පිටපත් ගොනුවක් (PDF) යොමු කර තිබූ බවත්;

(ආ) එකී ගොනුවේ අන්තර්ගතය ලෙස පක්ෂයේ විධායක මණ්ඩල සභිකයන් දෙදෙනෙකු වන ජනිත විපුලගුණ (6 වන විත්තිකරු) සහ ජයන්ත නාහල්ල (7 වන විත්තිකරු) යන අය වෙත පිළිවෙලින් 2024.11.24 සහ 2024.11.8 යන දිනවලදී පැමිණිලිකරු විසින් යොමු කරන ලද බවට හැඟවෙන පරිදි පැමිණිලිකරුගේ අත්සනේ ඡායාරූපයක් පරිගණක තාක්ෂණය ඇසුරින් යොදාගෙන සකස් කරන ලද ව්‍යාජ ලිපි දෙකක් යවා ඇති බවත්;

(ඇ) එකී ලිපියන්හි පාරදත්ත ('Meta Data') පරීක්ෂා කිරීමේදී එම ලිපි 1 වන විත්තිකරු විසින් 2026.02.23 වන දින නිර්මාණය කර ඇති බවට වෝහාරිකව තහවුරු වන බවත්;

(ඇ) එබැවින් පැමිණිලිකරු විසින් වහාම 2026.02.24 වන දින පොලිස්පති වෙත මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් කරන ලද බවත්ය.

*එකී කරුණ සනාථ කිරීම සඳහා ඉහත කී සාවද්‍ය ලිපිහි පිටපත් සහ 2026.02.24 වන දිනැති TELL-IGP/2026/1295 දරණ පැමිණිල්ලේ පිටපතක් පිලිවෙලින් **'X-35(අ)'**, **'X-35(ආ)'**, **'X-35(ඇ)'** **'X-35(ඈ)'** සහ **'X-35(ඉ)'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

29. තවදුරටත් මෙම පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ, උද්දේශිතව පැවැත්වීමට නියමිත 2026.03.01 දිනැති පක්ෂ රැස්වීමේදී පැමිණිලිකරු දරණ තනතුරෙන් ඔහුව ඉවත් කිරීමට 2 වන විත්තිකරු අදහස් කරන බවත්, ඔහුගේ අරමුණු පිළිබිඹු කරන තවත් එක් අවස්ථාවක් ලෙස එකී විත්තිකරුගේ වට්සැප් ගිණුමෙන් පැමිණිලිකරු වෙත යොමු කරන ලද එක් වරක් පමණක් සවන්දිය හැකි හඬ පටයකදී ඔහු විසින් පැමිණිලිකරුට තර්ජනාත්මකව '**ඕෂල ඔයාගේ තනතුර මම විසින් ඔයාට දෙන ලද හිඟමනක් විතරයි. ඒ හිඟමන රැකගන්න මීට එහා ඔයා කටයුතු කරන්න ගියොත් මේ තනතුර මං වහාම අහෝසි කරනවා**' ලෙස පවසා ඇති බවත්ය.

*එකී කරුණ සනාථ කිරීම සඳහා 2 වන විත්තිකරුගේ වට්සැප් ගිණුමෙන් පැමිණිලිකරු වෙත යොමු කරන ලද එක් වරක් පමණක් සවන්දිය හැකි හඬ පටය ඇතුළත් පණිවිඩය පෙන්නුම් කරන තිරපිටපත සහ එකී එක් වරක් පමණක් සවන්දිය හැකි හඬ පටය වෙනත් ජංගම දුරකතනයකින් පටිගත කර ගත් බව පෙන්නුම් කරන තිරපිටපත සම්පිණ්ඩනයක් ලෙස **'X-36'** ලෙස සලකුණු කොට මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය කොටස් ලෙස අයැදමින් මේ සමග අමුණා ඉදිරිපත් කර සිටී.*

<u>විත්තිකරුවන්ට එරෙහිව උපවය වී ඇති 1 වන නඩු නිමිත්ත</u>

30. මෙම පැමිණිලිකරු ඉහත කී 1 සිට 29 දක්වා ඡේදයන්හි ඇති සම්ප්‍රකාශ පුනරුච්චාරණය කර සිටින අතර, වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ 1 සිට 7 දක්වා විත්තිකරුවන්, ඉහත කී අවස්ථානුගත කරුණු අනුව, එකී පක්ෂයේ ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බැවින්, එකී විත්තිකරුවන්ට එරෙහිව පහත සහන ලබා ගැනීම සඳහා පැමිණිලිකරුට නඩු නිමිත්තක් උපවය වී ඇති බවයි;

i. වර්ෂ 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම එකී පක්ෂයේ ව්‍යවස්ථාවට අනුව කැඳවන ලද හෝ පවත්වන ලද පක්ෂයේ විධායක සභා රැස්වීමක් නොවන බවට **<u>ප්‍රකාශයක්</u>** ලබා ගැනීම සඳහා;

ii. වර්ෂ 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීමේදී ගන්නා ලද තීරණ පක්ෂයේ ව්‍යවස්ථාවට අනුව බල රහිත සහ/හෝ බල ශුන්‍ය තීරණ බවට **<u>ප්‍රකාශයක්</u>** ලබා ගැනීම සඳහා;

iii. වර්ෂ 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීමේදී ගන්නා ලද තීරණ මත ක්‍රියා කිරීමට විත්තිකරුවන්ට සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අයට සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට, අයිතියක් සහ/හෝ හිමිකමක් නොමැති බවට **<u>ප්‍රකාශයක්</u>** ලබා ගැනීම සඳහා;

iv. 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ '***X-30'***, සහ/හෝ ***'X-34(ආ)'*** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමත් කැඳවීමට සහ/හෝ පැවැත්වීමට සහ/හෝ පවත්වා තීරණ ගැනීමට 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන්ට සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අයට සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට අයිතියක් සහ/හෝ හිමිකමක් නොමැති බවට **<u>ප්‍රකාශයක්</u>** ලබා ගැනීම සඳහා;

v. 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ '***X-30'*** සහ/හෝ ***'X-34(ආ)'*** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමත් මගින් ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීමට 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන්ට සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් අයිතියක් සහ/හෝ හිමිකමක් නොමැති බවට **<u>ප්‍රකාශයක්</u>** ලබා ගැනීම සඳහා;

vi. වර්ෂ 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීමේදී ගන්නා ලද තීරණ මත ක්‍රියා කිරීමට 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන **<u>ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක්</u>** ලබා ගැනීමටත්;

vii. 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ '***X-30'***, සහ/හෝ ***'X-34(ආ)'*** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමත් කැඳවීමෙන් සහ/හෝ පැවැත්වීමෙන් සහ/හෝ පවත්වා තීරණ ගැනීමෙන් 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන **<u>ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක්</u>** ලබා ගැනීමටත්;

viii. 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ '***X-30'***, සහ/හෝ ***'X-34(ආ)'*** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත

ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමේදී ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීමට 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන **ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක්** ලබා ගැනීමටත්;

ix. මෙම නඩුව අසා තීරණය කරන තෙක් 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීමේදී ගන්නා ලද තීරණ මත ක්‍රියා කිරීමට 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන **අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක්** ලබා ගැනීමටත්;

x. මෙම නඩුව අසා තීරණය කරන තෙක් 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ '***X-30***' සහ/හෝ ***'X-34(ආ)'*** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමත් කැඳවීමෙන් සහ/හෝ පැවැත්වීමෙන් සහ/හෝ පවත්වා තීරණ ගැනීමෙන් 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන **අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක්** ලබා ගැනීමටත්;

xi. මෙම නඩුව අසා තීරණය කරන තෙක් 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ '***X-30'***, සහ/හෝ ***'X-34(ආ)'*** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමේදී ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීමට 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන **අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක්** ලබා ගැනීමටත්;

xii. අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් සඳහා වන පැමිණිලිකරුගේ ඉල්ලීම අසා තීරණය කරන තෙක් 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීමේදී ගන්නා ලද තීරණ මත ක්‍රියා කිරීමට 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන **වාරණ නියෝගයක්** ලබා ගැනීමටත්;

xiii. අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් සඳහා වන පැමිණිලිකරුගේ ඉල්ලීම අසා තීරණය කරන තෙක් 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ **'*X-30*'** සහ/හෝ **'*X-34(ආ)*'** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමත් කැඳවීමෙන් සහ/හෝ පැවැත්වීමෙන් සහ/හෝ පවත්වා තීරණ ගැනීමෙන් 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන **වාරණ නියෝගයක්** ලබා ගැනීමටත්;

xiv. අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් සඳහා වන පැමිණිලිකරුගේ ඉල්ලීම අසා තීරණය කරන තෙක් 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ **'*X-30*',** සහ/හෝ **'*X-34(ආ)*'** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමේදී ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීම 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන **වාරණ නියෝගයක්** ලබා ගැනීම සඳහාද වේ.

**විත්තිකරුවන්ට එරෙහිව උපවය වී ඇති 2 වන නඩු නිමිත්ත**

31. මෙම පැමිණිලිකරු ඉහත 1 සිට 30 දක්වා ඡේදයන්හි ඇති කරුණු පුනරුච්චාරණය කර සිටින අතර, වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ 1 වන විත්තිකරු පක්ෂයේ ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් 2 වන විත්තිකරු නව පක්ෂ නායක කිරීම උදෙසා 1 වන විත්තිකරු සතු බලතල 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් සමග එක්ව අනීතික ලෙස ක්‍රියාත්මක කරන බැවින් එකී විත්තිකරුවන්ට එරෙහිව පහත සහන ලබා ගැනීම සඳහා පැමිණිලිකරුට නඩු නිමිත්තක් උපවය වී ඇති බවයි.

i. 1 වන විත්තිකරුට, "අභිනව නිවහල් පෙරමුණ" පක්ෂයේ ව්‍යවස්ථාවේ නියමිත ක්‍රමවේදයන්ට අනුකූල නොවී වාර්ෂික මහා සභා සහ විශේෂ මහාසභා රැස්වීම් කැඳවීමට නීතිමය බලයක් නොමැති බවත්, එවැනි රැස්වීම් හා ඒවා මඟින් ගනු ලබන තීරණ නීතියේ දී ශූන්‍ය සහ බල රහිත වන බවට **ප්‍රකාශයක්** ලබා දෙන ලෙසත්;

ii. 1 වන විත්තිකරු, පක්ෂ ව්‍යවස්ථාවට අනුකූල නොවන ආකාරයෙන් කැඳවන හෝ කැඳවීමට උත්සාහ කරන මහා සභා හෝ විධායක සභා රැස්වීම් හරහා, පක්ෂයේ නායකත්වය, නිලධාරී මණ්ඩලය හෝ ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධයෙන් තීරණ ගන්නා ලෙස කටයුතු කිරීමෙන්, එවැනි තීරණ ක්‍රියාත්මක කිරීමෙන්, හෝ එවැනි තීරණ පදනම් කරගනිමින් කටයුතු කිරීමෙන්, වැළැක්වීමට **ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක්** නිකුත් කරන ලෙසත්;

iii. මෙම නඩුව අසා තීරණය කරන තෙක් 1 වන විත්තිකරු, පක්ෂ ව්‍යවස්ථාවට අනුකූල නොවන ආකාරයෙන් කැඳවන හෝ කැඳවීමට උත්සාහ කරන මහා සභා හෝ විධායක සභා රැස්වීම් හරහා, පක්ෂයේ නායකත්වය, නිලධාරී මණ්ඩලය හෝ ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධයෙන් තීරණ ගන්නා ලෙස කටයුතු කිරීමෙන්, එවැනි තීරණ ක්‍රියාත්මක කිරීමෙන්, හෝ එවැනි තීරණ පදනම් කරගනිමින් කටයුතු කිරීමෙන්, වලක්වාලන **<u>අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක්</u>** නිකුත් කරන ලෙසත්;

iv. අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් සඳහා වන පැමිණිලිකරුගේ ඉල්ලීම අසා තීරණය කරන තෙක් 1 වන විත්තිකරු, පක්ෂ ව්‍යවස්ථාවට අනුකූල නොවන ආකාරයෙන් කැඳවන හෝ කැඳවීමට උත්සාහ කරන මහා සභා හෝ විධායක සභා රැස්වීම් හරහා, පක්ෂයේ නායකත්වය, නිලධාරී මණ්ඩලය හෝ ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධයෙන් තීරණ ගන්නා ලෙස කටයුතු කිරීමෙන්, එවැනි තීරණ ක්‍රියාත්මක කිරීමෙන්, හෝ එවැනි තීරණ පදනම් කරගනිමින් කටයුතු කිරීමෙන්, වැළැක්වීමට **<u>වාරණ නියෝගයක්</u>** නිකුත් කරන ලෙසත් වේ.

**<u>විත්තිකරුවන්ට එරෙහිව උපවය වී ඇති 3 වන නඩු නිමිත්ත</u>**

32. මෙම පැමිණිලිකරු ඉහත 1 සිට 31 දක්වා ඡේදයන්හි ඇති කරුණු පුනරුච්චාරණය කර සිටින අතර, වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ 2 වන විත්තිකරු අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ ව්‍යවස්ථාවට පටහැනිව, පක්ෂ නායක ලෙස පෙනී සිටිමින් සමාජය සහ පාක්ෂිකයින් නොමඟ යවමින් සහ එකී විත්තිකරුගේ පෞද්ගලික අදහස් පක්ෂයේ අදහස් ලෙස හුවා දක්වමින් පක්ෂයේ කීර්ති නාමට හානි කරමින් කටයුතු කරන බවත්, එකී විත්තිකරුගේ අනීතික ක්‍රියා වෙනුවෙන් 1 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් සමග එක්ව වංකව කටයුතු කරන බැවින් එකී විත්තිකරුවන්ට එරෙහිව පහත සහන ලබා ගැනීම සඳහා පැමිණිලිකරුට නඩු නිමිත්තක් උපවය වී ඇති බවයි;

i. 2 වන විත්තිකරු ‘‘අභිනව නිවහල් පෙරමුණ’’ පක්ෂයේ නීත්‍යානුකූල නායකයෙකු නොවන බවත්, එම පක්ෂයේ නායක ලෙස හෝ පක්ෂය නියෝජනය කරන අයෙකු ලෙස පෙනී සිටීමට, ප්‍රකාශ කිරීමට හෝ කටයුතු කිරීමට නීතිමය බලයක් නොමැති බවත්, එවැනි කටයුතු සියල්ල නීතියේ දී බල රහිත වන බවත් බවට **<u>ප්‍රකාශයක්</u>** ලබා දෙන ලෙසත්;

ii. 2 වන විත්තිකරු, ‘‘අභිනව නිවහල් පෙරමුණ’’ පක්ෂයේ නායක ලෙස හෝ පක්ෂය නියෝජනය කරන අයෙකු ලෙස පෙනී සිටීමෙන්, ප්‍රකාශ කිරීමෙන්, ලිපි හෝ සමාජ මාධ්‍ය මගින් හෝ වෙනත් ආකාරයකින් මහජනතාව නොමඟ යැවීමෙන් වැළැක්වීමට **<u>ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනම්</u>** නියෝගයක් නිකුත් කරන ලෙසත්;

iii. මෙම නඩුව අසා තීරණය කරන තෙක් 2 වන විත්තිකරු, ‘‘අභිනව නිවහල් පෙරමුණ’’ පක්ෂයේ නායක ලෙස හෝ පක්ෂය නියෝජනය කරන අයෙකු ලෙස පෙනී සිටීමෙන්, ප්‍රකාශ කිරීමෙන්, ලිපි හෝ සමාජ මාධ්‍ය මගින් හෝ වෙනත් ආකාරයකින් මහජනතාව නොමඟ යැවීමෙන් වලක්වාලන **<u>අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක්</u>** නිකුත් කරන ලෙසත්;

iv. අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් සඳහා වන පැමිණිලිකරුගේ ඉල්ලීම අසා තීරණය කරන තෙක් 2 වන විත්තිකරු, "අභිනව නිවහල් පෙරමුණ" පක්ෂයේ නායක ලෙස හෝ පක්ෂය නියෝජනය කරන අයෙකු ලෙස පෙනී සිටීමෙන්, ප්‍රකාශ කිරීමෙන්, ලිපි හෝ සමාජ මාධ්‍ය මගින් හෝ වෙනත් ආකාරයකින් මහජනතාව නොමඟ යැවීමෙන් වැළැක්වීමට **වාරණ නියෝගයක්** නිකුත් කරන ලෙසත් වේ.

**විත්තිකරුවන්ට එරෙහිව උපචය වී ඇති 4 වන නඩු නිමිත්ත**

33. මෙම පැමිණිලිකරු ඉහත 1 සිට 32 දක්වා ඡේදයන්හි ඇති කරුණු පුනරුච්චාරණය කර සිටින අතර, වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ ඉහත අවස්ථානුගත කරුණු අනුසාරයෙන් විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට එරෙහිව පහත සහන ලබා ගැනීම සඳහා පැමිණිලිකරුට නඩු නිමිත්තක් උපචය වී ඇති බවයි;

i. පැමිණිලිකරු "අභිනව නිවහල් පෙරමුණ" පක්ෂයේ නීත්‍යානුකූල සභාපතිවරයා ලෙස කටයුතු කිරීමට හිමිකම් ඇති බවට **ප්‍රකාශයක්** ලබා දෙන ලෙසත්;

ii. පැමිණිලිකරු සභාපති ලෙස කටයුතු කිරීම අවහිර කිරීමෙන්, පැමිණිලිකරුගේ ධුර බලතල භාවිතා කිරීම වලක්වාලීමෙන්, වෙනත් පුද්ගලයෙකු සභාපති ලෙස හඳුන්වා දීමෙන්, 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වැළැක්වීමට **ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක්** නිකුත් කරන ලෙසත්;

iii. මෙම නඩුව අසා තීරණය කරන තෙක් පැමිණිලිකරු සභාපති ලෙස කටයුතු කිරීම අවහිර කිරීමෙන්, පැමිණිලිකරුගේ ධුර බලතල භාවිතා කිරීම වලක්වාලීමෙන්, වෙනත් පුද්ගලයෙකු සභාපති ලෙස හඳුන්වා දීමෙන්, 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන **අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක්** නිකුත් කරන ලෙසත්;

iv. අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් සඳහා වන පැමිණිලිකරුගේ ඉල්ලීම අසා තීරණය කරන තෙක් පැමිණිලිකරු සභාපති ලෙස කටයුතු කිරීම අවහිර කිරීමෙන්, පැමිණිලිකරුගේ ධුර බලතල භාවිතා කිරීම වලක්වාලීමෙන්, වෙනත් පුද්ගලයෙකු සභාපති ලෙස හඳුන්වා දීමෙන්, 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වැළැක්වීමට **වාරණ නියෝගයක්** නිකුත් කරන ලෙසත් වේ.

34. මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ මෙහි අයැද ඇති වාරණ නියෝග සහ අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝග ගරු අධිකරණය විසින් නිකුත් නොකළහොත් පැමිණිලිකරුට පිරිමැසිය නොහැකි සහ අප්‍රතිකාරී හානි සහ පාඩු සිදුවනු ඇති බවයි.

35. මුද්දර ගාස්තු කාර්යය සඳහා මෙම නඩුවේ වටිනාකම රු. 1,000,0000/- ලෙස තක්සේරු කර සිටී.

36. ඉහත සඳහන් සම්ප්‍රකාශයන්හි කරුණු තහවුරු කිරීම සඳහා මෙම පැමිණිලිකරුගේ දිවුරුම් ප්‍රකාශය මේ සමඟ ගොනු කර සිටී.

<u>**එසේ හෙයින් මෙම පැමිණිලිකරු ගරු අධිකරණයෙන් ගෞරවයෙන් අයැද සිටින්නේ,**</u>

(අ) වර්ෂ 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම එකී පක්ෂයේ ව්‍යවස්ථාවට අනුව කැඳවන ලද හෝ පවත්වන ලද පක්ෂයේ විධායක සභා රැස්වීමක් නොවන බවට ප්‍රකාශ කරන නඩු තීන්දුවක් දානය කොට තීන්දු ප්‍රකාශ ගත කරන ලෙසත්;

(ආ) වර්ෂ 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීමේදී ගන්නා ලද තීරණ පක්ෂයේ ව්‍යවස්ථාවට අනුව බල රහිත සහ/හෝ බල ශුන්‍ය තීරණ බවට ප්‍රකාශ කරන නඩු තීන්දුවක් දානය කොට තීන්දු ප්‍රකාශ ගත කරන ලෙසත්;

(ඇ) වර්ෂ 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීමේදී ගන්නා ලද තීරණ මත ක්‍රියා කිරීමට විත්තිකරුවන්ට සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අයට සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට, අයිතියක් සහ/හෝ හිමිකමක් නොමැති බවට ප්‍රකාශ කරන නඩු තීන්දුවක් දානය කොට තීන්දු ප්‍රකාශ ගත කරන ලෙසත්;

(ඈ) 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ ***'X-30'*** සහ/හෝ ***'X-34(ආ)'*** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමත් කැඳවීමට සහ/හෝ පැවැත්වීමට සහ/හෝ පවත්වා තීරණ ගැනීමට 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන්ට සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අයට සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට අයිතියක් සහ/හෝ හිමිකමක් නොමැති බවට ප්‍රකාශ කරන නඩු තීන්දුවක් දානය කොට තීන්දු ප්‍රකාශ ගත කරන ලෙසත්;

(ඉ) 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ '***X-30'*** සහ/හෝ ***'X-34(ආ)'*** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමත් මගින් ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීමට 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන්ට සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් අයිතියක් සහ/හෝ හිමිකමක් නොමැති බවට ප්‍රකාශ කරන නඩු තීන්දුවක් දානය කොට තීන්දු ප්‍රකාශ ගත කරන ලෙසත්;

(ඊ) 1 වන විත්තිකරුට, "අභිනව නිවහල් පෙරමුණ" පක්ෂයේ ව්‍යවස්ථාවේ නියමිත ක්‍රමවේදයන්ට අනුකූල නොවී වාර්ෂික මහා සභා සහ විශේෂ මහාසභා රැස්වීම් කැඳවීමට නීතිමය බලයක් නොමැති බවත්, එවැනි රැස්වීම් හා ඒවා මගින් ගනු ලබන තීරණ නීතියේ දී ශුන්‍ය සහ බල රහිත වන බවට ප්‍රකාශ කරන නඩු තීන්දුවක් දානය කොට තීන්දු ප්‍රකාශ ගත කරන ලෙසත්;

(උ) 2 වන විත්තිකරු "අභිනව නිවහල් පෙරමුණ" පක්ෂයේ නීත්‍යානුකූල නායකයෙකු නොවන බවත්, එම පක්ෂයේ නායක ලෙස හෝ පක්ෂය නියෝජනය කරන අයෙකු ලෙස පෙනී සිටීමට, ප්‍රකාශ කිරීමට හෝ කටයුතු කිරීමට නීතිමය බලයක් නොමැති බවත්, එවැනි කටයුතු සියල්ල නීතියේ දී බල රහිත වන බවත් බවට ප්‍රකාශ කරන නඩු තීන්දුවක් දානය කොට තීන්දු ප්‍රකාශ ගත කරන ලෙසත්;

(ඌ) පැමිණිලිකරු "අභිනව නිවහල් පෙරමුණ" පක්ෂයේ නීත්‍යානුකූල සභාපතිවරයා ලෙස කටයුතු කිරීමට හිමිකම් ඇති බවට ප්‍රකාශ කරන නඩු තීන්දුවක් දානය කොට තීන්දු ප්‍රකාශ ගත කරන ලෙසත්;

(එ) වර්ෂ 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීමේදී ගන්නා ලද තීරණ මත ක්‍රියා කිරීමට 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් දානය කරන ලෙසත්;

(ඒ) 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ '***X-30'***, සහ/හෝ ***'X-34(ආ)'*** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමත් කැඳවීමෙන් සහ/හෝ පැවැත්වීමෙන් සහ/හෝ පවත්වා තීරණ ගැනීමෙන් 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් දානය කරන ලෙසත්;

(ඓ) 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ '***X-30'*** සහ/හෝ ***'X-34(ආ)'*** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමේදී ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීමට 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් දානය කරන ලෙසත්;

(ඔ) 1 වන විත්තිකරු, පක්ෂ ව්‍යවස්ථාවට අනුකූල නොවන ආකාරයෙන් කැඳවන හෝ කැඳවීමට උත්සාහ කරන මහා සභා හෝ විධායක සභා රැස්වීම් හරහා, පක්ෂයේ නායකත්වය, නිලධාරී මණ්ඩලය හෝ ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධයෙන් තීරණ ගන්නා ලෙස කටයුතු කිරීමෙන්, එවැනි තීරණ ක්‍රියාත්මක කිරීමෙන්, හෝ එවැනි තීරණ පදනම් කරගනිමින් කටයුතු කිරීමෙන්, වැළැක්වීමට ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් දානය කරන ලෙසත්;

(ඕ) 2 වන විත්තිකරු, "අභිනව නිවහල් පෙරමුණ" පක්ෂයේ නායක ලෙස හෝ පක්ෂය නියෝජනය කරන අයෙකු ලෙස පෙනී සිටීමෙන්, ප්‍රකාශ කිරීමෙන්, ලිපි හෝ සමාජ මාධ්‍ය මගින් හෝ වෙනත් ආකාරයකින් මහජනතාව නොමඟ යැවීමෙන් වැළැක්වීමට ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් දානය කරන ලෙසත්;

(ඖ) පැමිණිලිකරු සභාපති ලෙස කටයුතු කිරීම අවහිර කිරීමෙන්, පැමිණිලිකරුගේ ධූර බලතල භාවිතා කිරීම වලක්වාලීමෙන්, වෙනත් පුද්ගලයෙකු සභාපති ලෙස හඳුන්වා දීමෙන්, 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වැළැක්වීමට ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් දානය කරන ලෙසත්;

(ක) මෙම නඩුව අසා තීරණය කරන තෙක් 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීමේදී ගන්නා ලද තීරණ මත ක්‍රියා කිරීමට 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් දානය කරන ලෙසත්;

(ග) මෙම නඩුව අසා තීරණය කරන තෙක් 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ '***X-30'*** සහ/හෝ ***'X-34(ආ)'*** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමත් කැඳවීමෙන් සහ/හෝ පැවැත්වීමෙන් සහ/හෝ පවත්වා තීරණ ගැනීමෙන් 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් දානය කරන ලෙසත්;

(ඞ) මෙම නඩුව අසා තීරණය කරන තෙක් 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ '***X-30',*** සහ/හෝ ***'X-34(ආ)'*** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමේදී ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීමට 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් දානය කරන ලෙසත්;

(ච) මෙම නඩුව අසා තීරණය කරන තෙක් 1 වන විත්තිකරු, පක්ෂ ව්‍යවස්ථාවට අනුකූල නොවන ආකාරයෙන් කැඳවන හෝ කැඳවීමට උත්සාහ කරන මහා සභා හෝ විධායක සභා රැස්වීම් හරහා, පක්ෂයේ නායකත්වය, නිලධාරී මණ්ඩලය හෝ ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධයෙන් තීරණ ගන්නා ලෙස කටයුතු කිරීමෙන්, එවැනි තීරණ ක්‍රියාත්මක කිරීමෙන්, හෝ එවැනි තීරණ පදනම් කරගනිමින් කටයුතු කිරීමෙන්, වලක්වාලන අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් දානය කරන ලෙසත්;

(ඡ) මෙම නඩුව අසා තීරණය කරන තෙක් 2 වන විත්තිකරු, "අභිනව නිවහල් පෙරමුණ" පක්ෂයේ නායක ලෙස හෝ පක්ෂය නියෝජනය කරන අයෙකු ලෙස පෙනී සිටීමෙන්, ප්‍රකාශ කිරීමෙන්, ලිපි හෝ සමාජ මාධ්‍ය මගින් හෝ වෙනත් ආකාරයකින් මහජනතාව නොමඟ යැවීමෙන් වලක්වාලන අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් දානය කරන ලෙසත්;

(ට) මෙම නඩුව අසා තීරණය කරන තෙක් පැමිණිලිකරු සභාපති ලෙස කටයුතු කිරීම අවහිර කිරීමෙන්, පැමිණිලිකරුගේ ධුර බලතල භාවිතා කිරීම වලක්වාලීමෙන්, වෙනත් පුද්ගලයෙකු සභාපති ලෙස හඳුන්වා දීමෙන්, 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් දානය කරන ලෙසත්;

(ඩ) අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් සඳහා වන පැමිණිලිකරුගේ ඉල්ලීම අසා තීරණය කරන තෙක් 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීමේදී ගන්නා ලද තීරණ මත ක්‍රියා කිරීමට 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන **වාරණ නියෝගයක්** දානය කරන ලෙසත්;

(ණ) අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් සඳහා වන පැමිණිලිකරුගේ ඉල්ලීම අසා තීරණය කරන තෙක් 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ ***'X-30'*** සහ/හෝ ***'X-34(ආ)'*** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමත් කැඳවීමෙන් සහ/හෝ පැවැත්වීමෙන් සහ/හෝ පවත්වා තීරණ ගැනීමෙන් 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන **වාරණ නියෝගයක්** දානය කරන ලෙසත්;

(ත) අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් සඳහා වන පැමිණිලිකරුගේ ඉල්ලීම අසා තීරණය කරන තෙක් 2026.02.12 වන දින අභිනව නිවහල් පෙරමුණ පක්ෂයේ විධායක සභා රැස්වීමක් යැයි හුවා දක්වා පවත්වන ලද ඊනියා රැස්වීම මත සහ/හෝ ***'X-30'*** සහ/හෝ ***'X-34(ආ)'*** ලෙස සලකුණු කර ඇති 2026.02.19 දිනැති විශේෂ නිවේදනය මගින් දන්වා ඇති පරිදි 2026.03.01 වන දින පෙරවරු 11.00 ට මහනුවර සංස්කෘතික මධ්‍යස්ථානයේදී, පැවැත්වීමට නියමිත ඊනියා මහා සභා රැස්වීමත්, එදින පස්වරු 1.00 ට පැවැත්වීමට නියමිත ඊනියා විශේෂ මහා සභා රැස්වීමේදී ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීම 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වලක්වාලන **වාරණ නියෝගයක්** දානය කරන ලෙසත්;

(ද) අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් සඳහා වන පැමිණිලිකරුගේ ඉල්ලීම අසා තීරණය කරන තෙක් 1 වන විත්තිකරු, පක්ෂ ව්‍යවස්ථාවට අනුකූල නොවන ආකාරයෙන් කැඳවන හෝ කැඳවීමට උත්සාහ කරන මහා සභා හෝ විධායක සභා රැස්වීම් හරහා, පක්ෂයේ නායකත්වය, නිලධාරී මණ්ඩලය හෝ ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධයෙන් තීරණ ගන්නා ලෙස කටයුතු කිරීමෙන්, එවැනි තීරණ ක්‍රියාත්මක කිරීමෙන්, හෝ එවැනි තීරණ පදනම් කරගනිමින් කටයුතු කිරීමෙන්, වැළැක්වීමට **වාරණ නියෝගයක්** දානය කරන ලෙසත්;

(න) අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් සඳහා වන පැමිණිලිකරුගේ ඉල්ලීම අසා තීරණය කරන තෙක් 2 වන විත්තිකරු, "අභිනව නිවහල් පෙරමුණ" පක්ෂයේ නායක ලෙස හෝ පක්ෂය නියෝජනය කරන අයෙකු ලෙස පෙනී සිටීමෙන්, ප්‍රකාශ කිරීමෙන්, ලිපි හෝ

සමාජ මාධ්‍ය මගින් හෝ වෙනත් ආකාරයකින් මහජනතාව නොමඟ යැවීමෙන් වැළැක්වීමට **<u>වාරණ නියෝගයක්</u>** දානය කරන ලෙසත්;

(ප) අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් සඳහා වන පැමිණිලිකරුගේ ඉල්ලීම අසා තීරණය කරන තෙක් පැමිණිලිකරු සභාපති ලෙස කටයුතු කිරීම අවහිර කිරීමෙන්, පැමිණිලිකරුගේ ධුර බලතල භාවිතා කිරීම වලක්වාලීමෙන්, වෙනත් පුද්ගලයෙකු සභාපති ලෙස හඳුන්වා දීමෙන්, 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන විත්තිකරුවන් සහ/හෝ ඔවුන් යටතේ කටයුතු කරන අය සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් වැළැක්වීමට **<u>වාරණ නියෝගයක්</u>** දානය කරන ලෙසත්;

(බ) නඩු ගාස්තු සහ

(ම) මෙම ගරු අධිකරණයට සුදුසු යැයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහන ලබා දෙන ලෙසත්ය.

**පැමිණිලිකරුගේ ලේඛණගත නීතීඥ**